සබරගමුව පළාත් සභාව - சப்ரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council

අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாச்சார நடவடிக்கைகளுக்கான அமைச்சு
Ministry of Education, Information Technology & Cultural Affairs
Email – edusabaram@gmail.com www.moe.sg.gov.lk

PMoE Sabaragamuwa

අමාත්‍යාංශ ලේකම් Secretary — Office – 045 2223015

කාර්යාලය Office — නවනගරය,රත්නපුර. Newtown, Rathnapura. Office - 045 2222542 Fax - 045 2228042

මගේ අංකය / எனது இல / My Number — MEDU/AD/02 ( සබර/චක්‍රලේඛ )

ඔබේ අංකය / உமது இல / Your Number —

දිනය / திகதி / Date — 2024.03. 18

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සබරගමුව පළාත් පාසල් වල සියළුම විදුහල්පතිවරුන්.

**පළාත් අධ්‍යාපන චක්‍රලේඛ අංක : සබර/2024/02**

**<u>පාසල් ක්‍රීඩා පිටි හා ගොඩනැගිලි රාත්‍රී කාලයේ විවිධ වැඩසටහන් සඳහා බාහිර පාර්ශවයන්ට ලබා දීම</u>**

පාසල් තුල අධ්‍යාපනික කටයුතු හා ඊට අදාල බාහිර ක්‍රියාකාරකම් රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සිදුවිය යුතුය.

02. රාත්‍රී කාලයේ පැවැත්වෙන විවිධ උත්සව සහ වැඩසටහන් සඳහා බාහිර පාර්ශවයන් විසින් පාසල් ගොඩනැගිලි හා ක්‍රීඩා පිටි ඉල්ලුම් කරනු ලබන අවස්ථා සැලකිල්ලට ගෙන එවැනි ඉල්ලීම් සම්බන්ධව වැඩසටහනේ යෝග්‍යතාව හා අවශ්‍යතාව සළකා බලා තම නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම සියළුම විදුහල්පතිවරුන්ගේ හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ වගකීමක් වේ.

03. විදුහල්පතිවරුන්ගේ හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ සැලකිල්ලට ගෙන එම වැඩසටහන්වල යෝග්‍යතාව හා අවශ්‍යතාව පිළිබඳව පෞද්ගලිකව සෑහීමට පත්ව <u>සුවිශේෂ අවස්ථාවන්හි දී පමණක් රාත්‍රී කාලයේ පැවැත්වෙන වැඩසටහන් වෙනුවෙන්</u> අවශ්‍ය අනුමැතිය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පමණක් ලබාදිය යුතුය.

04. එලෙස තම නිර්දේශ හා අනුමැතිය ලබාදීමේ දි පහත කොන්දේසි හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමට සියළු දෙනා වගබලා ගත යුතුය.

I. ඉදිරිපත් වන ඉල්ලීමේ ස්වභාවය හා ක්‍රීඩා පිටියේ පවතින පහසුකම් හා ධාරිතාවය සැළකිල්ලට ගෙන අවමය රු:5000.00 ක සිට රු:15000.00 දක්වා උපරිමයක් වන ලෙස තැන්පතුවක් පාසල් සංවර්ධන සමිති ගිණුමට බැර කිරීම. ( මෙම ගාස්තුව දිවා /රාත්‍රී දෙකෙහිම පවත්වන වැඩසටහනක් සේ සළකා තීරණය කර ඇති අතර රාත්‍රී පැවැත්වෙන වැඩසටහන් වෙනුවෙන්ද මෙම සම්පූර්ණ ගාස්තුව අදාළ වේ )

II. පාසලට යම් අලාභයක් සිදුවුවහොත් එය පියවා ගැනීම සඳහා ආපසු ගෙවනු ලබන රු25000.00 ක මුදලක් පාසල් සංවර්ධන සමිති ගිණුමට බැර කර රිසිට්පතක් නිකුත් කිරීම.

III. අදාල කාර්ය අවසන් වීමෙන් පසු හානි පාඩු ගණනය කර ආපසු ගෙවීම් කළයුතු අතර අයවීම් ඇත්නම් අයකර ගත යුතුය.

IV. මේ සම්බන්ධව කටයුතු කිරීමට හා ගනුදෙනු සඳහා වෙනම ලේඛන පවත්වා ගත යුතුය.

V. පාසලේ මානව හා භෞතික සම්පත් ආරක්ෂා වන පරිදි කටයුතු කළ යුතුය.

VI. පාසලේ පවිත්‍රතාවය රැකීම සඳහා අදාල පාර්ශවයන් එකඟ කර ගත යුතුය.

VII. ඉහත කොන්දේසි ප්‍රකාරව කටයුතු කරන බවට අදාල පාර්ශව වෙතින් ලිඛිත එකඟතාවයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

05. මගේ අංක ME/E/02 (සබර/චක්‍රලේඛ) / පළාත් අධ්‍යාපන චක්‍රලේඛ අංක : සබර/2022/02(1) හා 2022.12.20 දරන චක්‍රලේඛය මෙයින් අවලංගු කරන අතර, මගේ අංක : ME/E/02 (සබර/චක්‍රලේඛ) අංක : සබර/2023/02 හා 2023.03.20 දරන චක්‍රලේඛය තවදුරටත් වලංගු වේ.

06. මෙම චක්‍රලේඛය මගින් ආවරණය නොවන කරුණු සම්බන්ධයෙන් අවසන් තීරණය අමාත්‍යාංශ ලේකම් සතුවන බව වැඩිදුරටත් දන්වමි.

බී.ජේ.සී.පී. බමුණුආරච්චි
ලේකම්
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
නවනගරය - රත්නපුර

බී.ජේ.සී.පී. බමුණුආරච්චි,
ලේකම්,
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

පිටපත් :-

01. ප්‍රධාන ලේකම්,ස.ප.ස. - කා.දැ.ගැ.ස.
02. ආණ්ඩුකාර ලේකම්,ස.ප.ස. - කා.දැ.ගැ.ස.
03. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ සියළුම මාණ්ඩලික නිලධාරින් - කා.දැ.ගැ.ස.